# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1984 අංක 1 දරන ගම්පහ තරුණ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1984 ජනවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිල : ශත 45 යි  තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 1 දරන ගම්පහ තරුණ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

**එල්. ඩී.—ඕ. 28/83**

**ගම්පහ තරුණ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ගම්පහ තරුණ බෞද්ධ සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එහි සාමාජිකයන් එකඟ වන රීති අනුව, එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා වර්ෂ එක් දහස් නවසිය හතලිස් එකේදී පිහිටුවනු ලැබූ හෙයින් ද: පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සමිතිය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් හා එම සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1984 අංක 1 දරන ගම්පහ තරුණ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගම්පහ තරුණ බෞද්ධ සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ගම්පහ තරුණ බෞද්ධ සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද කැම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. ගම්පහ තරුණ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බෞද්ධ අධ්‍යාපනයේ ව්‍යාප්තිය සඳහා පහසුකම් සැලසීම;

(ආ) බුද්ධ ධර්මය පිළිපැදීමට අනුබල දීම;

(ඇ) බෞද්ධයන් අතර සමගිය සහ සහයෝගය තහවුරු කිරීම;

(ඈ) බෞද්ධයන්ගේ අධ්‍යාත්මික, සංස්කෘතික, ශාරීරික හා සමාජයීය අභිවෘද්ධිය සැලසීම;

(ඉ) බෞද්ධ අයිතිවාසිකම් රැක බලා ගැනීම; සහ

(ඊ) ප්‍රදේශයේ බෞද්ධ හා සංස්කෘතික කටයුතු නංවාලීම සහ කරගෙන යාම සඳහා මධ්‍යස්ථානයක් ඉදි කිරීම, පවත්වා ගෙන යාම සහ පාලනය කිරීම.

4. (1) නිලධාරීන්ගෙන් සහ සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීති අනුව තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වන විධායක කාරක සභාවක් විසින් සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය. විධායක කාරක සභාව.

(2) මේ පනත ආරම්භ වන දිනයෙහි ධුර දරන සමිතියේ විධායක කාරක සභාව සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව වන්නේ ය.

සංස්ථාවේ රීති.

5. (1) සංස්ථාව විසින් කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී, පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක කැමැත්තෙන් සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම පිණිස ද සංස්ථාවේ විධායක කාරක සභාවේ හා විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ සුදුසුකම් ඉටු කිරීම පිණිස ද, රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා හා එහි පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ද මේ පනතේ විධිවිධාන වලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. ඒ රීති සාදා සම්මත කරනු ලැබීමෙන් පසු එවැනිම රැස්වීමක දී ඒ ආකාරයෙන්ම, ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සියලු සාමාජිකයන් සෑමවිට ම සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අය විය යුතු ණය.

6. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පවත්නා සමිතියේ සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සමිතියට අයවිය යුතු සියලු ණය හා සමිතියට ගෙවිය යුතු සම්මාදම් හා දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

7. විධායක කාරක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය. ඒ අත්සන් තැබීම යම් නැනැත්තකු සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් තැබීමට අතිරේක ව විය යුතු ය.

සංස්ථාවට චංචල සහ නිශ්චල දේපළ තබාගත හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ යම් චංචල හෝ නිශ්චල දේපළක් ගෙන තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට හැකි විය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සම්පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත්කාලයේ වලංගුව පවතින රීතිවලට යටත්ව, ඒ සියලු දේපළ මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාව විසින් තබාගත යුතු ය. තවද සංස්ථාවේ කාර්යයන් සඳහා යම් ඇපයක් ඇතිව හෝ නැතිව මුදල් ලබා ගැනීම හෝ ණයට ගැනීම කරනු ලැබිය හැකි ය.

5. (1) සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර මණ්ඩලයක් සංස්ථාවට තිබිය යුතු ය. **භාරකාර මණ්ඩලය.**

(2) මේ පනත ආරම්භ වන දිනයේදී ධුර දරන සමිතියේ භාරකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතු ය. භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක, මණ්ඩලයේ ඉතිරි සාමාජිකයන් විසින් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සුදුසු සහ නිසි තැනැත්තකු තෝරා පත් කර ගැනීමෙන් ඒ පුරප්පාඩුව පිරවිය යුතු ය.

(3) (අ) යම් තැනැත්තකු සංස්ථාවේ යාවජීව සාමාජිකයකු නොවේ නම්,

(ආ) යම් තැනැත්තකුගේ සංස්ථාවේ සාමාජිකත්වය වර්ෂ පහකට අඩුනම්,

(ඇ) නිසි බලය ඇති අධිකරණයක් විසින් යම් තැනැත්තකු වස්තු භංගත්වයට පත් වූවකු ලෙස විනිශ්චය කරනු ලැබ තිබේ නම්,

(ඈ) නිසි බලය ඇති අධිකරණයක් විසින් යම් තැනැත්තකු සිහි විකල වූවකු ලෙස විනිශ්චය කරනු ලැබ තිබේ නම්,

(ඉ) යම් තැනැත්තකු වයස අවුරුදු හතලිහකට අඩු නම්,

එවැනි තැනැත්තකු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තෝරා පත් කර ගනු නොලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ විධිමත් ලෙස සංස්ථාපිත රැස්වීමක දී මණ්ඩලයේ සාමාජිකයන් හතර දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් අනුමත කරනු ලැබිණි නම්, ඒ ක්‍රියාව හෝ තීරණය මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක් බල රහිත නොවිය යුතු ය. එසේම බල රහිත යයි සලකනු නොලැබිය යුතු ය.

(5) සංස්ථාවේ විධායක කාරක සභාවේ කිසිම ක්‍රියාවක්, සංස්ථාවේ මහා සභා රැස්වීමක දී ඒ ක්‍රියාව සඳහා කලින් බලය පවරනු ලැබිණි නම් සහ මණ්ඩලයේ රැස්වීමක දී මණ්ඩලයේ බහුතර තීරණයකින් බලය පවරනු ලැබිණි නම් මිස, සංස්ථාවේ දේපළවල යම් අයිතියක් හෝ මුදල් අන්සතු කිරීමේ කාර්යය සඳහා සහ සංස්ථාවට විරුද්ධව යම් බැරකමක් හෝ හිමිකමක් ඇති කිරීමේ කාර්යය සඳහා වලංගු හෝ බලසහිත නො විය යුතු ය :

එසේ වුවද පහත සඳහන් යම් අවස්ථාවක දී එවැනි බලය පැවරීමක් අවශ්‍ය නොවන්නේ ය :—

(අ) එක් අවුරුද්දක් නොඉක්මවන කාල සීමාවක් සඳහා යම් නිශ්චල දේපළක් බදු දීම ;

(ආ) රුපියල් එක් දහසක් නොඉක්මවන වටිනාකමකින් යුක්ත යම් චංචල දේපළක් බැහැර කිරීම.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින්, ඔවුන් ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනා යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තු පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.